WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## 63 - ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

### අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය**

| | |
|---|---|
| ප්‍රශ්න අංක 01 - 40 (01 X 40) | ලකුණු 40 |

**II පත්‍රය**

| | | |
|---|---|---|
| 1. ප්‍රශ්නය | ලකුණු 20 | |
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04 කට ලකුණු 40 |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |

| | |
|---|---|
| I පත්‍රය | ලකුණු 40 |
| II පත්‍රය | ලකුණු 60 |
| අවසාන | ලකුණු 100 |

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

WWW.OLEVELAPI.COM

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II**
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

**2018.12.12 / 0830 - 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** විමල්, අමල් හා සුනිමල් පහත සඳහන් ආකාරයෙන් ව්‍යාපාර කටයුතුවල නියැලෙති.

විමල් : ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කර, ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන, නව ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම
අමල් : ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කර, ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන, නව නිපැයුමක් කිරීම
සුනිමල් : ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කර, ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන, භාණ්ඩ ආනයනය කිරීම

මොවුන් අතුරෙන් ව්‍යාපාර ව්‍යවසායකයකු/ව්‍යවසායිකයින් ලෙස සැලකිය හැක්කේ
(1) විමල් ය. (2) අමල් හා සුනිමල් ය. (3) සුනිමල් ය. (4) විමල් හා සුනිමල් ය.

**2.** ව්‍යාපාර පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A - යහමින් මුදල් යෙදවීමෙන් ආරම්භ කරන ඕනෑම ව්‍යාපාරයක් සාර්ථක වේ.
B - ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේදී බාහිර පරිසරය පිළිබඳ පුරෝකථනය කිරීම අවිනිශ්චිත ය.

ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ඉහත ප්‍රකාශ
(1) A හා B නිවැරදි වේ. (2) A හා B වැරදි වේ.
(3) A නිවැරදි වන අතර B වැරදි වේ. (4) A වැරදි වන අතර B නිවැරදි වේ.

WWW.OLEVELAPI.COM

**3.** ඉහළ වැටුපක් ලබන රැකියාවක් කිරීමට පුද්ගලයින් තුළ ඇති කැමැත්ත හැඳින්විය හැක්කේ ව්‍යවසායකත්වයට එරෙහි වන
(1) සාමාජයීය සාධකයක් ලෙස ය. (2) ආර්ථික සාධකයක් ලෙස ය.
(3) සංස්කෘතික සාධකයක් ලෙස ය. (4) දේශපාලන සාධකයක් ලෙස ය.

**4.** ව්‍යවසායකයා විසින් තම ව්‍යාපාරයේ අනාගත කටයුතු මනාව සැලසුම් කළ යුතු ය. මෙම කුසලතාව හැඳින්විය හැක්කේ
(1) විශ්ලේෂණාත්මක කුසලතාව ලෙස ය.
(2) මානව කුසලතාව ලෙස ය.
(3) තාක්ෂණික කුසලතාව ලෙස ය.
(4) සංකල්පනාත්මක කුසලතාව ලෙස ය.

**5.** ව්‍යවසායකයා තමාගේම ස්වාමියා වීමට කැමැත්තක් දක්වයි. මෙයින් විස්තර කරන ගති ලක්ෂණය වනුයේ
(1) සුභවාදීබවයි. (2) අධිෂ්ඨානශීලීබවයි. (3) නම්‍යශීලීබවයි. (4) ස්වාධීනබවයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

6. ව්‍යවසායකයෙකු පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශනය කුමක් ද?
   (1) තක්සේරුවකින් තොරව ඉහළ අවදානමක් දරමින් ඉහළ ප්‍රතිලාභ ලැබීමට කැමැත්තක් නොදක්වන පුද්ගලයා ය.
   (2) හොඳ තක්සේරුවකින් පසුව ඕනෑම අවදානමක් දැරීමට කැමැත්තක් දක්වන පුද්ගලයා ය.
   (3) සෑම විටම තමාගේ සාර්ථකත්වය තමාගේ දෛවය හා වාසනාව මත රඳා පවතින බව විශ්වාස කරන පුද්ගලයා ය.
   (4) සෑම විටම දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරමින් පරිසරයේ ඇති වන වෙනස්වීම්වලට අනුගත නොවෙමින් ව්‍යාපාර කටයුතු මෙහෙයවන පුද්ගලයා ය.

7. ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වනුයේ
   (1) නිෂ්පාදන කටයුත්තක නියැලීමයි.
   (2) ලාභ ලැබීමයි.
   (3) ප්‍රචාරණයයි.
   (4) සීමිත සම්පත් භාවිතයයි.

8. ව්‍යවසායකයෙකු සිය ව්‍යාපාරය සඳහා ශක්තීන් හඳුනාගැනීම සඳහා, විශ්ලේෂණය කරනුයේ
   (1) අභ්‍යන්තර පරිසරයයි. (2) ආසන්න පරිසරයයි. (3) බාහිර පරිසරයයි. (4) ගෝලීය පරිසරයයි.

9. ව්‍යවසායකයින් දැඩි ප්‍රතිපත්ති හා මතවාද අනුගමනය **නොකිරීමේ** ලක්ෂණය හැඳින්විය හැක්කේ
   (1) නම්‍යශීලි බව ලෙස ය.
   (2) ආත්ම විශ්වාසය ලෙස ය.
   (3) ස්වයං පෙළඹවීම ලෙස ය.
   (4) කැපවීම ලෙස ය.

10. 'රජය විසින් බදු අනුපාත ඉහළ නැංවීම ව්‍යාපාරයකට තර්ජනයකි.' මෙය හඳුනාගත හැකි පරිසරය වනුයේ
   (1) ආසන්න පරිසරයයි.
   (2) දේශපාලන හා නෛතික පරිසරයයි.
   (3) සමාජ හා සංස්කෘතික පරිසරයයි.
   (4) ආර්ථික පරිසරයයි.

11. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරය කුමක් ද?
   (1) සුපිරි වෙළඳසැල
   (2) ඇඟළුම් නිෂ්පාදන ආයතනය
   (3) රජයේ රෝහල
   (4) ග්‍රාමීය බැංකුව

12. ව්‍යාපාරයක ආසන්න පරිසරයේ බලවේගයක් වනුයේ
   (1) අයිතිකරුවන් ය.
   (2) තරඟකරුවන් ය.
   (3) කළමනාකරුවන් ය.
   (4) විදේශීය ආයෝජකයන් ය.

13. පොදු අරමුණක් ලඟා කර ගැනීමට ඒකරාශී වූ පුද්ගල කණ්ඩායමක් හඳුන්වනු ලබනුයේ
   (1) සංවිධානයක් ලෙස ය.
   (2) දෙපාර්තමේන්තුවක් ලෙස ය.
   (3) සංස්ථාවක් ලෙස ය.
   (4) ජාලයක් ලෙස ය.

14. පියල් තම සේවකයින් සඳහා අදාළ අර්ථසාධක අරමුදල් නිසිලෙස ගෙවයි. ඔහු සම්පූර්ණ කරනුයේ
   (1) ආර්ථික වගකීමකි.
   (2) නීතිමය වගකීමකි.
   (3) සදාචාරාත්මක වගකීමකි.
   (4) පරාර්ථකාමී වගකීමකි.

15. කමල් බැංකු ණය මුදලක් ලබාගෙන, පවුලේ සහභාගිත්වය ඇති ව, සැලසුම් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත නොකර ඉක්මනින් ම ව්‍යාපාර කටයුතු ආරම්භ කළේ ය. එහෙත් ඔහුට ව්‍යාපාරය සාර්ථකව කරගෙන යාමට නොහැකි විය. කමල්ගේ ව්‍යාපාරය අසාර්ථක වීමට බල පෑ හේතුවක් විය හැක්කේ
   (1) ණය මුදල් මගින් ව්‍යාපාරය ආරම්භ කිරීම ය.
   (2) පවුලේ සාමාජිකයින් ව්‍යාපාර කටයුතුවලට සහභාගී කර ගැනීම ය.
   (3) ව්‍යාපාරය නිසි ලෙස සැලසුම් නොකිරීම ය.
   (4) සීමිත ප්‍රාග්ධනයකින් ආරම්භ කිරීම ය.

WWW.OLEVELAPI.COM

16. රජය විසින් දේශීය කර්මාන්ත දිරිමත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සැලකිය හැක්කේ
   (1) ශක්තියක් ලෙස ය.
   (2) දුර්වලතාවයක් ලෙස ය.
   (3) අවස්ථාවක් ලෙස ය.
   (4) තර්ජනයක් ලෙස ය.

17. අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ කිහිපයක් පහත වේ.
   A - නිර්මාණය කළ හැකි බව
   B - සියලුදෙනාට පොදු බව
   C - පුද්ගලයාට අනුව වෙනස් වන බව
   D - සීමිත බව

   නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) A හා C වුවමනා වන අතර B හා D අවශ්‍යතා වේ.
   (2) A හා B වුවමනා වන අතර C හා D අවශ්‍යතා වේ.
   (3) A, B හා D වුවමනා වන අතර C අවශ්‍යතා වේ.
   (4) B හා C වුවමනා වන අතර A හා D අවශ්‍යතා වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**18.** විද්‍යුත් වෙළඳාම සැලකිය හැක්කේ
(1) දිගුවක් ලෙස ය. (2) නව සොයාගැනීමක් ලෙස ය.
(3) අනුකරණයක් ලෙස ය. (4) සංකලනයක් ලෙස ය.

**19.** බැංකු සේවා සපයන ව්‍යාපාර ආයතන අයත් වනුයේ
(1) ප්‍රාථමික අංශයට ය. (2) ද්විතියික අංශයට ය.
(3) තෘතියික අංශයට ය. (4) කාර්මික අංශයට ය.

**20.** ජංගම දුරකතනය හරහා මුදල් හුවමාරු කිරීමේ සේවාව හැඳින්විය හැක්කේ
(1) පවතින සේවාවක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(2) පවතින සේවාවක් නව වෙළඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(3) නව සේවාවක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(4) නව සේවාවක් නව වෙළඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.

**21.** කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකය වන්නේ
(1) සංස්ථාපන සහතිකයයි.
(2) ප්‍රාදේශීය ලේකම් සහතිකයයි.
(3) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකයයි.
(4) තනි ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයයි.

**22.** පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වඩාත් උචිත උපායමාර්ගයක් වනුයේ
(1) නිෂ්පාදිත ප්‍රභේදනයන් හඳුන්වා දීම ය.
(2) ගුණත්වය අඩු කර මිල පහළ දැමීම ය.
(3) බැංකු ණයක් ලබාගෙන ව්‍යාපාර කටයුතු ප්‍රසාරණය කිරීම ය.
(4) නව සේවකයන් බඳවා ගැනීම ය.

**23.** 'අවදානම භාරගන්නා පුද්ගලයාට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අත්පත් කරදීමේ හැකියාව ඇති ආකර්ශනීය ආයෝජන අවස්ථාවක්' හඳුනාගත හැකි වන්නේ
(1) ව්‍යාපාර අදහසක් ලෙස ය.
(2) හොඳ ව්‍යාපාර කටයුත්තක් ලෙස ය.
(3) ව්‍යාපාර අවස්ථාවක් ලෙස ය.
(4) ව්‍යවසායකයකුගේ හැකියාවක් ලෙස ය.

**24.** යම් අයකුගේ නව සොයාගැනීමක් වෙනුවෙන් ලබාදෙන රජයේ සහතිකය වනුයේ
(1) ප්‍රමිත සහතිකයයි. (2) පේටන්ට් බලපත්‍රයයි.
(3) නව නිපැයුම් සහතිකයයි. (4) තත්ත්ව සහතිකයයි.

**25.** ව්‍යාපාරයට අවශ්‍ය සේවකයින් පිළිබඳ තොරතුරු ඇතුළත් වනුයේ
(1) මූල්‍ය සැලැස්මේ ය. (2) අලෙවි සැලැස්මේ ය.
(3) පරිපාලන සැලැස්මේ ය. (4) නිෂ්පාදන සැලැස්මේ ය.

**26.** පොදු අංශයේ ව්‍යාපාර සංවිධානයක් වනුයේ
(1) සංස්ථාපිත සමාගම ය. (2) රාජ්‍ය සමාගම ය.
(3) පෞද්ගලික සමාගම ය. (4) හවුල් ව්‍යාපාරය ය.

WWW.OLEVELAPI.COM

**27.** ව්‍යාපාර සැලැස්මක් යනු
(1) ව්‍යාපාරයේ කාර්යයන් හඳුනාගෙන ඒවා සිදු කරන ආකාරය විධිමත්ව පෙන්නුම් කරන ලේඛනයකි.
(2) ව්‍යාපාරය ලඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉදිරිපත් කරන ලේඛනයකි.
(3) ව්‍යාපාරය ලඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු සහ ඒවා ලඟා කර ගැනීමට අපේක්ෂිත විවිධ කාර්යයන් පෙන්නුම් කරන ලේඛනයකි.
(4) පරිසරයේ විවිධ වෙනස්කම්වලට අනුගත වන ආකාරය පෙන්නුම් කරන ලේඛනයකි.

**28.** අපනයන භාණ්ඩවල තත්ත්වය පරීක්ෂා කිරීම, ආනයන පරීක්ෂාව වැනි මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබාදෙනුයේ
(1) කාර්මික තාක්ෂණ ආයතනයයි. (2) ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයයි.
(3) කාර්මික සංවර්ධන මණ්ඩලයයි. (4) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයයි.

**29.** නිෂ්පාදිත ප්‍රභේදනයක් ලෙස සැලකිය හැක්කේ
(1) නව කිරි පිටි වර්ගයක් හඳුන්වා දීමයි.
(2) සහනදායි මිලකට කිරි පිටි ලබා දීමයි.
(3) විශේෂ වට්ටම් සහන ලබා දීමයි.
(4) ආර්ථික පිරිමැසුම් සහිත කුඩා කිරි පැකට්ටුවක් හඳුන්වා දීමයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**30.** ඒකක නිෂ්පාදන පිරිවැය ගණනය කරනු ලබන නිවැරදි ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) $\frac{\text{මුළු නිෂ්පාදනය}}{\text{නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව}}$ (2) $\frac{\text{මුළු නිෂ්පාදනය}}{\text{ද්‍රව්‍ය පිරිවැය}}$

(3) $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදන පිරිවැය}}$ (4) $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව}}$

**31.** ව්‍යවසායකයා සහ ව්‍යාපාරිකයා අතර ඇති සමානතාවක් **නොවන්නේ**

(1) අවදානමකට මුහුණ දීමයි. (2) තරගයකට මුහුණ දීමයි.
(3) ස්වයං පෙළඹවීමයි. (4) සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.

**32.** පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(1) සංස්ථාපිත සමාගම් (2) අධිකාරි (3) සංස්ථා (4) දෙපාර්තමේන්තු

**33.** රෝෂිණී තම ව්‍යාපාරයට රු. 200 000 ක් ප්‍රාග්ධනය ලෙස යෙද වූ අතර එයින් වත්කම් මිල දී ගැනීමට ඇය රු. 75 000 ක මුදලක් වැය කළා ය. මෙම විස්තරයට අනුව වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) ව්‍යාපාරයේ මුළු ආයෝජනය රු. 275 000 ක් වන අතර රු. 75 000 ක වත්කම් මිල දී ගැනීම මුදල් ගලායාමකි.
(2) ව්‍යාපාරයේ ස්ථාවර වත්කම් රු. 75 000 ක් වන අතර ණය හිමියෝ රු. 125 000 කි.
(3) රු. 200 000 ක මුදල මුදල් ගලා ඒමක් වන අතර රු. 75 000 ක වත්කම් මිල දී ගැනීම මුදල් ගලා යාමකි.
(4) මුදල් ශේෂය රු. 125 000 ක් වන අතර මුළු මුදල් ගලා යාම රු. 275 000 කි.

**34.** සංස්ථාපිත සමාගමක මූලික ලක්ෂණයක් **නොවන්නේ**

(1) අයිතිකරුවන් විසින් ප්‍රාග්ධනය යෙදවීමයි.
(2) නෛතික පුද්ගලභාවයක් හිමිවීමයි.
(3) කළමනාකරණ කටයුතු අධ්‍යක්ෂවරුන් මගින් සිදු කිරීමයි.
(4) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීමයි.

**35.** නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් **නොවන්නේ**

(1) නිමැවුම ය. (2) යෙදවුම ය. (3) සැපයුම ය. (4) පරිවර්තන ක්‍රියාවලිය ය.

● පහත සිද්ධිය ඇසුරින් අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කවිඳු රෙදිපිළි නිෂ්පාදන ආයතනයක් පවත්වා ගෙන යයි. ඔහුගේ මුළු සේවක සංඛ්‍යාවෙන් 50% ක් ආබාධිත රණවිරුවන් වේ. කවිඳු නවීන මෝස්තරවලට අනුකූලව රෙදිපිළි නිෂ්පාදනය කරයි. ඔහු බැංකු ණය මුදලක් ලබාගෙන ඇති අතර ඒ සඳහා ඉහළ පොලී ප්‍රමාණයක් ගෙවයි. කෙසේ වෙතත් ඔහු තම ව්‍යාපාරයට අදාළ බදු මුදල් නියමිත පරිදි ගෙවන අතර තම ව්‍යාපාරය සඳහා රු. මිලියන 2ක රක්ෂණ ආවරණයක් ද ලබා ගෙන ඇත. කවිඳු ව්‍යාපාර කටයුතු සැලැසුම්වලට අනුව සිදුවන්නේ දැයි නිරන්තරයෙන් සොයා බලයි.

**36.** කවිඳු සැලකිය හැක්කේ

(1) ආයතනික ව්‍යවසායකයකු ලෙස ය. (2) සමාජයීය ව්‍යවසායකයකු ලෙස ය.
(3) හරිත ව්‍යවසායකයකු ලෙස ය. (4) නිර්මාණශීලී ව්‍යවසායකයකු ලෙස ය.

**37.** ණය පොලී අනුපාතය ඉහළ යාමක් කවිඳුගේ ව්‍යාපාරයට බලපෑ හැක්කේ

(1) ශක්තියක් ලෙස ය. (2) අවස්ථාවක් ලෙස ය.
(3) තර්ජනයක් ලෙස ය. (4) තරඟකාරී වාසියක් ලෙස ය.

**38.** ව්‍යාපාර කටයුතු සැලැසුම්වලට අනුව සිදුවන්නේ දැයි සොයා බැලීමේ කාර්යය අයත් වන්නේ

(1) අයිතිකරුගේ භූමිකාවට ය. (2) කළමනාකරුගේ භූමිකාවට ය.
(3) නායකයාගේ භූමිකාවට ය. (4) නිෂ්පාදකයාගේ භූමිකාවට ය.

**39.** රක්ෂණ වාරික මුදල සැලකිය හැක්කේ

(1) නිෂ්පාදනයට වැය වෙන වෙනත් පිරිවැයක් ලෙස ය.
(2) ද්‍රව්‍ය පිරිවැයක් ලෙස ය.
(3) නිෂ්පාදිත ඒකක පිරිවැයක් ලෙස ය.
(4) පොදු කාර්ය පිරිවැයක් ලෙස ය.

**40.** 'නවීන මෝස්තරයන්ට අනුකූලව රෙදිපිළි නිෂ්පාදනය කිරීම.' මෙම ව්‍යවසායකත්ව ලක්ෂණය හැඳින්විය හැක්කේ

(1) කැපවීම ලෙස ය. (2) නම්‍යශීලීත්වය ලෙස ය.
(3) නිර්මාණශීලීත්වය ලෙස ය. (4) අවදානම් භාර ගැනීම ලෙස ය.

* *



WWW.OLEVELAPI

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 63 | විෂයය<br>பாடம் | ව්‍යවසායකත්ව අධ්‍යයනය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 3 | 31. | 4 |
| 02. | 4 | 12. | 2 | 22. | 1 | 32. | 1 |
| 03. | 1 | 13. | 1 | 23. | 3 | 33. | 3 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 4 |
| 05. | 4 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 06. | 1 හෝ 2 | 16. | 3 | 26. | 2 | 36. | 2 |
| 07. | 4 | 17. | 1 | 27. | 3 | 37. | 3 |
| 08. | 1 | 18. | 2 | 28. | 2 | 38. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 4 | 39. | 1 හෝ 4 |
| 10. | 2 | 20. | 3 | 30. | 4 | 40. | 3 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |
|---|---|---|---|



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

| | |
|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II |
| முயற்சியாண்மைக் கற்கை | I, II |
| Entrepreneurship Studies | I, II |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රත්නපුර ප්‍රදේශයේ ඉතා සුප්‍රසිද්ධ මැණික් ආභරණ නිෂ්පාදනය කර අලෙවිකරන 'ජෙම් ජුවලරි' ආයතනයට පැමිණි සුදේශ් හා ඔහුගේ විදේශ මිතුරකු වූ ඇලන්, ජෙම් ජුවලරි ආයතනයේ අධිපති වන කලණ විසින් ඉතා සුහදශීලී ලෙස පිළිගත් අතර සුළු වේලාවකින් ඔවුන් ඉතා කුලුපග මිතුරන් විය. ඔවුන් ව්‍යාපාර කටයුතු පිළිබඳ ගැඹුරු කතාබහකට යොමු වූ අතර කලණ තමා ආ ගමන් මග සුදේශ්ට සහ ඇලන්ට විස්තර කරනු ලැබුවේ මහත් ආඩම්බරයකින් ය. කලණ දැක්වූ අදහස්වලට අනුව ඔහුගේ උපන් ගම රත්නපුර වේ. පාසල් අවධියේදී ව්‍යාපාරයක් සාර්ථකව හා විධිමත් ආකාරයට පවත්වාගෙන යන ආකාරය පිළිබඳ හැදෑරූ කලණ අනාගතයේදී තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම පිළිබඳ සිහින දුටුවේ ය.

(අ.පො.ස.) උසස් පෙළ ඉහළින් සමත් වූ කලණ විශ්වවිද්‍යාලයට ඇතුළු විය. එහිදී ඔහු රසායන විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් ලබා ගත්තේ ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතරතුර මුහුණ දුන් ආර්ථික ගැටලු අවම කර ගැනීමටත් තමා තුළ වූ ව්‍යාපාරික සිහිනය යථාර්තයක් බවට පත් කර ගැනීමටත් වටිනාකමින් අඩු මැණික් කැට පතල්කරුවන්ගෙන් මිල දී ගෙන අලෙවි කළේ ය. කෙටි කාලයක් තුළ ඔහු සුළු පරිමාණ මැණික් ව්‍යාපාරිකයකු ලෙස ජනප්‍රිය විය. කලණ තම උපාධිය අවසන් කර, පවතින ව්‍යාපාර කටයුතු තව දුරටත් පුළුල් කළේ මැණික් කැටවලට රත්රන් එකතු කර වටිනාකම වැඩි කර, නවීන විලාසිතාවලට අනුව ස්වර්ණාභරණ නිෂ්පාදනය කරමින් ය. මෙම ව්‍යාපාරය 'ජෙම් ජුවලරි' නමින් පවත්වා ගෙන යන ලදී.

ජෙම් ජුවලරි ආයතනයේ 50% කට වැඩි සේවක පිරිස, එම ප්‍රදේශයේම අඩු ආදායම් ලබන පවුල්වලින් බඳවා ගෙන ඇත. සෑම වසරක් පාසා ම ප්‍රදේශයේ ඉතා දිළිඳු පවුලක් සඳහා නව නිවසක් සාදා දීම ද කලණගේ තවත් එක් කාර්යයක් විය. මීට අමතරව ව්‍යාපාර කටයුතු ක්‍රමවත් ආකාරයට පාලනය කළ කලණ රජයට ගෙවිය යුතු බදු මුදල් ද නිසි පරිදි ගෙවන ලදී.

(i) කලණ සාර්ථක ව්‍යවසායකයකු බව තහවුරු කිරීම සඳහා කරුණු **දෙකක්** දක්වන්න.
(ii) කලණගේ 'ජෙම් ජුවලරි' ව්‍යාපාරයේ ලියාපදිංචියට අදාළ නීතිමය තත්ත්වය පැහැදිලි කරන්න.
(iii) කලණ විසින් ඉටු කරනු ලබන සමාජයීය වගකීම් **දෙකක්** දක්වන්න.
(iv) සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් කලණගේ ව්‍යාපාරයට ලැබෙන වාසි **දෙකක්** දක්වන්න.
(v) කලණගේ ව්‍යවසායක කටයුතු තුළින් ඔහුට සහ දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ **දෙක** බැගින් දක්වන්න.

ඉහත සිද්ධියට අදාළ කලණගේ ව්‍යාපාරයේ ඉදිරි මාසය සඳහා වූ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු.) |
|---|---|
| විකුණුම් ආදායම | 5 000 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 2 000 000 |
| ශ්‍රම පිරිවැය | 400 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 180 000 |
| පරිපාලන වියදම් | 98 000 |
| බැංකු ණය | 1 000 000 |
| විකුණුම් වියදම් | 50 000 |

ඉහත තොරතුරු ඇසුරෙන් කලණගේ ව්‍යාපාරයේ,

(vi) ඉදිරි මාසය සඳහා වූ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කරන්න.
(vii) ඉදිරි මාසය සඳහා වූ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
(viii) ඉදිරි මාසය සඳහා වූ මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.
(ix) ඉදිරි මාසය සඳහා වූ ශුද්ධ ලාභය ගණනය කරන්න.
(x) මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යෑම් සඳහා උදාහරණය බැගින් දෙන්න.

(ලකුණු 02 × 10 = 20 යි)



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(i)

- නවීන විලාසිතාවලට අනුව (මැණික් හා රත්‍රන් එකතු කරමින්) ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම.
- අනාගතයේදී තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම පිළිබඳව කළණ සිහින දැකීම.
- කෙටි කාලයක් තුළ සුළු පරිමාණ මැණික් ව්‍යාපාරිකයෙකු ලෙස ජනප්‍රිය වීම.
- අඩු ආදායම්ලාභීන්ට රැකියා ලබාදීම
- රජයට නිසි පරිදි බදු ගෙවීම
- සෑම වසරකම අඩු ආදායම්ලාභී දිළිඳු පවුලක් සඳහා නව නිවසක් ලබාදීම

*(කරුණු 01කට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02යි)*

(ii)

- මෙම ව්‍යාපාරයේ නාමය 'ජෙම් ජුවලරි' වන නිසා එය ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීම ප්‍රයෝජනවත් වේ. මෙම ව්‍යාපාර නාමය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය.

*(ලකුණු 02යි)*

(iii)

- රජයට ගෙවිය යුතු බදු ගෙවීම
- දිළිඳු පවුලකට නව නිවසක් සාදා දීම
- අඩු ආදායම්ලාභීන්ට රැකියා අවස්ථා ලබාදීම

*(කරුණු 01කට ලකුණු 01 බැගින් කරුණු 02 කට ලකුණු 02යි)*

(iv)

- කීර්තිනාමය වර්ධනය වීම
- ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම ස්ථාපිත වීම
- නීතිමය ප්‍රශ්න අවම වීම
- ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම ඉහලයාම මගින් ලාභදායකත්වය තහවුරු වීම
- සේවකයන් ගේ චිත්ත ධෛර්ය ඉහල යාම
- ව්‍යාපාරය කෙරෙහි ඇති ලැදියාව වර්ධනය වීම

*(කරුණු 01කට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු 02 ක් සඳහා ලකුණු 02යි)*

WWW.OLEVELAPI.COM

(v)

කළණට හිමි වන ප්‍රතිලාභ :

- ආකර්ෂණීය ලාභයක් ඉපයීම
- ආත්ම තෘප්තිය
- කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම
- සමාජීය සුභසාධනයට දායකවිය හැකිවීම
- ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකිවීම
- ව්‍යාපාර කටයුතු තව දුරටත් පුළුල් කිරීමට ඇති අවස්ථාව
- ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම
- ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව

**(පිළිගත හැකි ඕනෑම කරුණක් සඳහා ලකුණු $^1/_2$ බැගින් කරුණු 02 කට ලකුණු 01 යි)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ :

- රැකියා අවස්ථා ජනනය කිරීම
- දේශීය සම්පත් භාවිතා කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම
- නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කිරීම
- ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම
- ආර්ථික සංවර්ධනයට දායකවීම
- විදේශ විනිමය ඉපයීමේ හැකියාව
- රටේ සමස්ත නිෂ්පාදනය ඉහලයාම
- ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් නිර්මාණය වීම

*(පිළිගත හැකි ඕනෑම කරුණක් සඳහා ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01 යි)*
*(මුළු ලකුණු 02 යි)*

(vi)

"ජෙම් ජුවලරි" ව්‍යාපාරය
ඉදිරි මාසය සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය *(ප්‍රශ්න අංක vi ලකුණු 1/2 යි)*

| | රු. | රු. | |
|---|---|---|---|
| විකුණුම් ආදායම *(ප්‍රශ්න අංක vi සඳහා ලකුණු 1/2 යි)* | | 5000000 | |
| අඩුකළා - මුළු නිෂ්පාදන පිරිවැය *(ප්‍රශ්න අංක vi සඳහා ලකුණු 1/2 යි)* | | | |
| අමුද්‍රව්‍ය පිරිවැය | 2000000 | | *(ප්‍රශ්න අංක vii සඳහා ලකුණු 1/2 බැගින් ලකුණු 01 1/2 යි)* |
| ශ්‍රම පිරිවැය | 400000 | | |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 180000 | | |
| | | (2580000) | *(ප්‍රශ්න අංක vii සඳහා ලකුණු 1/2 යි)* |
| අඩුකළා - මුළු නිෂ්පාදන නොවන පිරිවැය *(ප්‍රශ්න අංක vi ලකුණු 1/2 යි)* | | | |
| පරිපාලක වියදම් | 98000 | | *(ප්‍රශ්න අංක viii සඳහා ලකුණු 1/2 බැගින් ලකුණු 01 යි)* |
| විකුණුම් වියදම් | 50000 | | |
| | | (148000) | *(ප්‍රශ්න අංක viii සඳහා ලකුණු 01 යි)* |
| ශුද්ධ ලාභය | | 2272000 | |

**(ලකුණු 1/2 බැගින් අයිතම 04 සඳහා මුළු ආකෘතියටම ලකුණු 02 යි)**

(vii) රු. 2580,000

*(පිළිතුර සෘජුවම සපයා ඇත්නම් ලකුණු 02 යි. එසේ නොවේනම් ඉහත ආකෘතිය තුළ දක්වා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න.)*

(viii) රු. 148,000

WWW.OLEVELAPI.COM

*(පිළිතුර සෘජුවම සපයා ඇත්නම් ලකුණු 02 යි. එසේ නොවේනම් ඉහත ආකෘතිය තුළ දක්වා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න.)*

(ix) රු.2,272,000 *(ලකුණු 02)*

(x)

| <u>මුදල් ගලා ඒම්</u> | <u>මුදල් ගලා යාම්</u> |
|---|---|
| විකුණුම් ආදායම | බදු මුදල් ගෙවීම |
| බැංකු ණය | අමුද්‍රව්‍ය පිරිවැය |
| | ශ්‍රම පිරිවැය |
| | විකුණුම් වියදම් |
| | පරිපාලන වියදම් |
| | වෙනත් නිෂ්පාදන පිරිවැය |

**(මුදල් ගලා ඒමක් සඳහා ලකුණු 01, මුදල් ගලා යෑමක් සඳහා ලකුණු 01)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

2. (i) 'ව්‍යවසායකයින් රටකට සම්පතක් ලෙස සැලකිය හැකි ය.' කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) නිෂ්පාදන සාධක අතුරෙන් භූමිය සහ ප්‍රාග්ධනයෙහි ඇති ප්‍රධාන වෙනස සඳහන් කරන්න.
(iii) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය සංවර්ධනය කළ යුතු බව තහවුරු කිරීම සඳහා හේතු **හතරක්** සඳහන් කරන්න.
(iv) සාර්ථක ව්‍යවසායකයකුවීම සඳහා අවශ්‍ය වන සන්නිවේදන කුසලතා **දෙකක්** දක්වන්න.
(v) 'කුඩා ව්‍යාපාර රටේ සංවර්ධනයට සෘජුවම දායක වේ.' මෙම ප්‍රකාශය සනාථ කිරීමට අදාළ කරුණු **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

(i)

- දේශීය සම්පත් උපයෝජනය
- රටේ විවිධ ප්‍රදේශ සංවර්ධනය වීම
- නව භාණ්ඩ හා සේවා වෙළඳපළට ඉදිරිපත් කිරීම
- රටේ රැකියා අවස්ථා ජනනය වීම
- විදේශ විනිමය ඉපයීමේ හැකියාව
- රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යාම
- රටේ ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම
- ආර්ථික සංවර්ධනයට දායකවීම
- ස්වෛරී, නිවහල් ආර්ථිකයක් හා සමාජයක් නිර්මාණය වීම

*(ඉහත කරුණු 3ක් දැක්වීමට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 1 1/2*
*(පිළිතුරේ සම්බන්ධතාව පැහැදිලි කිරීමට ලකුණු $^1/_2$ යි)*
*(මුළු ලකුණු 02 යි)*

(ii)

- නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලුම ස්වාභාවික සම්පත් භූමිය වේ
- නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන මිනිසා විසින් නිපදවා ඇති සියලුම සම්පත් ප්‍රාග්ධන වේ.

*(භූමිය පිළිබඳව දැක්වීමට ලකුණු 01 යි*
*ප්‍රාග්ධනය පිළිබඳව දැක්වීමට ලකුණු 01 යි)*

(iii)

- ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තියට විසඳුමක් ලැබීම
- නව රැකියා නිර්මාණය කරන්නන් බිහි කර ගත යුතු වීම
- ආර්ථික වර්ධනයක් ලඟා කර ගත හැකිවීම
- භාවිතා නොවන සම්පත් සුලභව තිබීම
- ආදායම් බෙදීයාමේ විෂමතාව අවම කරගත හැකිවීම
- විදේශ විනිමය රට තුළට අද්දවා ගත යුතු වීම

*(එක් හේතුවකට ලකුණු $^1/_2$ බැගින් හේතු 4 කට ලකුණු 02 යි)*

(iv)

- අන්තර්ජාල හැසිරවීමේ කුසලතා
- රැස්වීම් පැවැත්වීම
- පණිවුඩ බෙදා හැරීම
- අදාළ පාර්ශවයන්ට අදාළ වාර්තා හා තොරතුරු බෙදා හැරීම
- තොරතුරු රැස් කිරීම
- තොරතුරු විශ්ලේෂණය කිරීම

*(එක් කරුණකට 01 බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)*



OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- සේවා නියුක්තිය වැඩිවීම
- ජාතික නිෂ්පාදනයට දායකවීම
- ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම
- මහා පරිමාණ ව්‍යාපාර නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම
- කාලයාගේ ඇවෑමෙන් මහා පරිමාණ ව්‍යාපාර බවට පත්වීම
- දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම

***(එක් කරුණකට $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)***

**3.** (i) ප්‍රාථමික අංශයේ ව්‍යාපාර සහ ද්විතියික අංශයේ ව්‍යාපාර සඳහා උදාහරණ **දෙක** බැගින් දක්වන්න.
(ii) ව්‍යාපාර ආචාරධර්ම තීරණය කිරීමේදී බලපෑම් ඇති කරන ප්‍රධාන පාර්ශ්ව **දෙකක්** නම් කරන්න.
(iii) කාන්තා ව්‍යවසායකත්වය වඩා ජනප්‍රිය ව්‍යාපාර ක්ෂේත්‍ර **හතරක්** සඳහන් කරන්න.
(iv) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් දියුණු කිරීම සඳහා යොදා ගත හැකි මූල්‍ය නොවන දිරිගැන්වීම් සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.
(v) විධායක සාරාංශයක් පිළියෙළ කිරීමේදී සැලකිය යුතු කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 × 5 = 10 යි)

(i)

| <u>ප්‍රාථමික අංශය</u> | <u>ද්විතියික අංශය</u> |
|---|---|
| මල් වගාව | සපත්තු නිෂ්පාදනය |
| දැව කර්මාන්තය | පොත් නිෂ්පාදනය |
| කුකුල් පාලනය | ගඩොල් නිෂ්පාදනය |
| කරදිය, මිරිදිය මසුන් ඇල්ලීම | ගොඩනැගිලි ඉදි කිරීම් |
| මැණික් කර්මාන්තය | පාලම් ඉදි කිරීම් |
| වැලි ගොඩ දැමීම | |
| හුණුගල් කර්මාන්තය | |

***(පිළිගත හැකි කරුණකට ලකුණු $^1/_2$ බැගින් අංශයක් යටතේ සඳහන් කර ඇති කරුණු 02 කට ලකුණු 01 යි)***

***(මුළු ලකුණු 02 යි)***

(ii)

- ව්‍යාපාරය ආරම්භ කරන්නන් (ප්‍රවර්ථකයන්)
- ආයතනයේ සාමාජිකයන්
- බාහිර සමාජය හෝ
  **ඇල්මැති පාර්ශවයන් සඳහන් කර ඇත්නම් එක් පාර්ශවයක් සඳහා ලකුණු 01 බැගින් පාර්ශවයන් 02 ක් සඳහා ලකුණු 02 යි**

***(මුළු ලකුණු 02 යි)***

(iii)

- සැකසූ ආහාර අලෙවි කිරීම
- පෙර පාසල්
- හෙද සේවය
- රූපලාවන්‍ය කටයුතු
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන
- විලාසිතා නිර්මාණ ආශ්‍රිත කටයුතු
- ලොන්ඩ්‍රි සේවය
- ඇඳුම් මැසීම

***(පිළිගත හැකි ව්‍යාපර ක්ෂේත්‍රයක් සඳහා ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)***

(iv)

- ව්‍යවසායකයන් පුහුණු කිරීම
- සේවකයන් පුහුණු කිරීම
- වෙළඳපොල සොයාදීම
- ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට උපදේශනය
- අලෙවිකරණ පුහුණුව
- තාක්ෂණික පුහුණුව ලබාදීම
- ඇසුරුම්කරණය පිළිබඳ දැනුම ලබාදීම

***(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)***



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(v)

- ආරම්භ කරන ව්‍යාපාරයේ නම හා ස්වභාවය පිළිබඳව
- අලෙවි සැලැස්ම හා එහි ඇතුළත් කරුණු පිළිබඳව
- පරිපාලන සැලැස්ම හා එහි ඇතුළත් කරුණු පිළිබඳව
- නිෂ්පාදන සැලැස්ම හා එහි ඇතුළත් කරුණු පිළිබඳව
- මූල්‍ය සැලැස්ම හා එහි ඇතුලත් කරුණු පිළිබඳව
- එක් පිටුවකට සීමා කිරීම

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)*

4. (i) ව්‍යවසායකයකුට රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතු **දෙකක්** දක්වන්න.
(ii) කේවල ස්වාමි ව්‍යාපාරවල සීමා **දෙකක්** සඳහන් කරන්න.
(iii) සංස්ථාපිත සමාගම් ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයින් වඩා උනන්දුවක් දැක්වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(iv) වරලත් ව්‍යාපාර ක්‍රියාත්මක කළ හැකි සංවිධාන වර්ග **දෙකක්** දක්වන්න.
(v) හවුල් ගිවිසුමක ඇතුළත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

(i)

- නව ව්‍යාපාර ආරම්භ කිරීමට උනන්දුව ඇති කරවීම
- ව්‍යාපාර අදහස් ව්‍යාපාර බවට පරිවර්තනය කිරීමට අවස්ථාව ලැබීම
- ආත්ම විශ්වාසය හා සුභවාදී ආකල්ප ඇති කරවීම
- සාර්ථක ප්‍රවේශයක් ලබාදීම
- සමාජයීය සුභසාධන කටයුතු පවත්වා ගෙන යාමට

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2කට ලකුණු 02 යි)*

(ii)

- ප්‍රාග්ධන සම්පාදන මාර්ග සීමාවීම
- නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම
- වගකීම අසීමිත වීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම
- අලාභ අයිතිකරුට තනිව දැරීමට සිදුවීම
- අයිතිකරු තනිව ගනු ලබන තීරණ අසාර්ථක වීම

WWW.OLEVELAPI.COM

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)*

(iii)

- නෛතික පුද්ගලභාවයක් හිමිවීම
- එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කල හැකි වීම
- වගකීම සීමිත වීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම
- විධිමත් බවක් හා පිළිගැනීමක් තිබීම
- පවුලේ සාමාජිකයන් හා නෑදෑයන් සම්බන්ධ කර ගත හැකිවීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකිවීම

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2 ට ලකුණු 02 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv)

- තනි පුද්ගල
- හවුල් ව්‍යාපාර
- සංස්ථාපිත සමාගම්

*(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)*

(v)

- ප්‍රාග්ධනය සපයන ආකාරය
- ලාභ පාඩු බෙදා ගන්නා ආකාරය
- හවුල්කරුවන් ව්‍යාපාර කටයුතුවලට දායක වන ආකාරය
- හවුල්කරුවන්ගේ වැටුප් ලබා ගැනීම පිළිබඳව
- හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව
- හවුල් ව්‍යාපාරයේ කටයුතු අවසන් කිරීම සම්බන්ධ තොරතුරු
- ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් සපයනු ලබන ණය සඳහා පොලී ගෙවීම පිළිබඳව
- හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වෙනත් පොදු එකඟතා පිළිබඳව

*(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)*

5. (i) වෙළඳපොළ විශ්ලේෂණයේදී අවශ්‍ය තොරතුරු රැස්කර ගත හැකි ක්‍රම **දෙකක්** දක්වන්න.
   (ii) අලෙවි සැලැස්මක් පිළියෙල කිරීමෙන් ව්‍යවසායකයාට ලබාගත හැකි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.
   (iii) අතීත ව්‍යාපාර පරිසරය හා සසඳා බැලීමේදී නූතන ව්‍යාපාර පරිසරයේ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
   (iv) වර්තමානයේදී නව තාක්ෂණය භාවිත කර භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කළ හැකි ආකාර **දෙකක්** දක්වන්න.
   (v) සුනිල් පෙරේරා ඇඟළුම් කර්මාන්තශාලා හිමිකරුවෙකි. ඔහුගේ ව්‍යාපාරයේ නිෂ්පාදනය කරනු ලබන ටී ෂර්ට් සඳහා වූ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන පිරිවැය අයිතම **හතරක්** දක්වන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

(i)

- පාරිභෝගිකයන්ට ප්‍රශ්නාවලි ලබාදීම මගින්
- සම්මුඛ සාකච්ඡා මගින්
- නිරීක්ෂණය මගින්
- පුවත්පත්/ සඟරා/ වාර්තා/ අන්තර්ජාලය වැනි මූලාශ්‍ර අධ්‍යයනය කිරීම

*(එක් කරුණකට ලකුණු 01බැගින් කරුණු 2 කට ලකුණු 02 යි)*

WWW.OLEVELAPI.COM

(ii)

- අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාවට ඇති ඉල්ලුම දැනගත හැක
- ඉලක්කගත පාරිභෝගිකයන් හඳුනා ගත හැකිවීම
- තරඟකරුවන්ගේ ස්වාභාවය හඳුනා ගත හැකිවීම
- තරඟකරුවන්ගේ අලෙවි උපක්‍රම ගැන දැන ගත හැක (මිල, ස්ථානය, ප්‍රවර්ධනය, නිෂ්පාදිතය)
- ව්‍යාපාරයේ අලෙවිකරණ උපායමාර්ග තීරණය කිරීම

*(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 02යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iii)

- යම් අවශ්‍යතාවයක් සපුරා ගැනීමට ඇති භාණ්ඩ හා සේවා රාශියක් වීම
- අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වී තිබීම
- තරඟකාරීත්වය වැඩි වීම
- පාරිභෝගිකයන් බලවත්වීම
- ලාභ අරමුණු පමණක් නොව සමාජ වගකීම වැනි වෙනත් අරමුණු තිබීම
- මූලික අවශ්‍යතා උසස් මට්ටමකින් සපුරා ගැනීමට උනන්දු වීම
- ගෝලීය වශයෙන් ව්‍යාප්ත වී තිබීම
- වෙනස්වීමේ වේගය ඉතා වැඩිවීම

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2කට ලකුණු 02යි)*

(iv)

- අන්තර්ජාලය
- මුහුණු පොත
- ජංගම දුරකථනය
- වෙබ් අඩවි
- කෙටි පණිවුඩ සේවා
- වට්ස් අප්
- වයිබර්

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2කට ලකුණු 02යි)*

(v)

- රෙදි
- නූල්
- බොත්තම්
- ශ්‍රමය
- විදුලිය
- මහන මැෂින් ක්ෂය
- ආරක්ෂක සේවක වැටුප්
- ජලය
- යන්ත්‍ර ක්ෂය
- කර්මාන්ත ශාලා රක්ෂණය

*(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 4කට ලකුණු 02යි)*

6. (i) හොඳ ව්‍යාපාර අදහසක් තෝරාගැනීමේ ක්‍රියාවලියේ පියවර **දෙකක්** සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර අදහස් සහ ව්‍යාපාර අවස්ථා අතර දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.
(iii) ඔබ කැමති ව්‍යාපාරයක් තෝරාගෙන එහි ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක් සහ තර්ජනයක් සඳහා නිදසුන බැගින් දක්වන්න.
(iv) ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේදී සලකා බැලිය යුතු සාධක **හතරක්** නම් කරන්න.
(v) නව ව්‍යවසායකයකු වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා අනුගමනය කළ හැකි විකල්ප මාර්ග **හතරක්** දක්වන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

(i)

- සාර්ව විශ්ලේෂණය
- සූක්ෂ්ම විශ්ලේෂණය
- ශඳුඅත විශ්ලේෂණය

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2කට ලකුණු 02යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ii)

- ව්‍යාපාර අදහස් සුලභය
  ව්‍යාපාර අවස්ථා සුලභ නොවේ

- ව්‍යාපාර අදහස් විවෘතයි. බොහෝ අය ඒවා දකියි
  ව්‍යාපාර අදහස් අතුරින් අවස්ථා අනාවරණය කර ගැනීම සියල්ලන්ටම කල නොහැක

- සෑම ව්‍යාපාර අදහසක්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැක
  ව්‍යාපාර අවස්ථා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැක.

*(එක් වෙනස්කමකට ලකුණු 01 බැගින් වෙනස්කම් 2 කට ලකුණු 02 යි)*

(iii) ශක්තීන්

- සම්පත් පැවැතීම
- දක්ෂ සේවකයින් සිටීම
- මූල්‍ය ස්ථාවරත්වය
- නිෂ්පාදිතවල ඉහළ ගුණාත්වය

දුර්වලතා

- මූල්‍ය දුෂ්කරතා
- යල් පැන ගිය තාක්ෂණය
- අමුද්‍රව්‍ය හිඟවීම
- සේවක කැපවීම අඩුවීම

අවස්ථා

- රාජ්‍ය දිරි ගැන්වීම්
- වැඩි පාරිභෝගික පිරිසක් සිටීම
- තරඟකරුවන් ඉවත්වීම
- තාක්ෂණය දියුණුවීම
- පර්යේෂණ හා සංවර්ධනයක් පැවතීම

තර්ජන

- අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම්
- අවාසිදායක නීතිරීති පැනවීම්
- ස්වාභාවික ආපදා හා විපත් නිරන්තරව පැමිණීම
- ආර්ථිකය අයහපත්වීම

*(සිසුවා විසින් තෝරා ගෙන ඇති ව්‍යාපාරයට අදාළව ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න)*

*(ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv)

- ව්‍යාපාරයක් සඳහා කෙතරම් කැපවිය හැකිද ?
- ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවාව කුමක්ද ?
- ඉලක්ක ගත පාරිභෝගිකයා කවුද ?
- තරඟයේ ස්වභාවය කෙබඳුද ?
- ඉපැයීම් ප්‍රමාණවත්ද ?
- ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේද ?
- තනිව හෝ හවුල්ව ව්‍යාපාරය ආරම්භ කරනවාද ?
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කෙබඳුද ?
- ව්‍යාපාරය තුලින් සමාජයට කවර ප්‍රතිලාභ අත්කර දිය හැකිද ?

***(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)***

(v)

- පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම
- පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම
- නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම
- නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම

***(එක් කරුණකට ලකුණු $^1/_2$ බැගින් කරුණු 4 කට ලකුණු 02 යි)***

7. පියල් රණසිංහ මහතාගේ තීන්ත ව්‍යාපාරය වෙනුවෙන් සැකසූ ව්‍යාපාර සැලැස්මේ තොරතුරු පහත දැක්වේ.

| **වියදම් ඇස්තමේන්තුව** | රු. |
|---|---|
| කර්මාන්තශාලා භූමිය සැකසීම | 20 000 |
| ජල පහසුකම් ලබා ගැනීම | 25 000 |
| තීන්ත සාම්පල පරීක්ෂාව | 10 000 |
| වෙළඳපොළ පර්යේෂණ වියදම් | 8 500 |
| ආරම්භක දින උත්සව වියදම් | 12 000 |
| බලපත්‍ර සඳහා ප්‍රාදේශීය සභාවට ගෙවීම් | 500 |
| තීන්ත කලවම් කිරීමේ යන්ත්‍රය මිල දී ගැනීම | 100 000 |
| පරිගණක යන්ත්‍ර දෙකක් මිල දී ගැනීම | 70 000 |

තීන්ත නිෂ්පාදනය සඳහා භාවිත කිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ල පියල් මහතාට අයත් වන අතර එහි වටිනාකම රු. 4 000 000 කි. තවද ඉදිරි සති දෙකක වියදම් සඳහා රු. 50 000 ක මුදලක් අවශ්‍ය බව තක්සේරු කර ඇත.

**අවශ්‍ය වන්නේ :**

(i) පියල් මහතාගේ ව්‍යාපාරයේ මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම ගණනය කිරීම (ලකුණු 03 යි)

(ii) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර අවශ්‍ය කරන මුළු වියදම්වල වටිනාකම ගණනය කිරීම (ලකුණු 03 යි)

(iii) මෙම ව්‍යාපාරයේ මුළු ආයෝජන මුදල ගණනය කිරීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 10 යි)

(i) <u>ස්ථාවර වත්කම්වල වටිනාකම</u>

| | |
|---|---|
| තීන්ත කවලම් කිරීමේ යන්ත්‍ර පිරිවැය | = රු. 100,000 |
| පරිගණක යන්ත්‍ර දෙක | = රු. 70,000 |
| ගොඩනැගිල්ල | = රු. <u>4,000,000</u> |
| | රු. <u>4,170,000</u> |

***(වටිනාකම සහිතව එක් අයිතමයකට ලකුණු 01 බැගින් අයිතම තුනට ලකුණු 3 යි. සැළුවම පිළිතුර සපයා ඇත්නම් ලකුණු 03 ලබා දෙන්න.)***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ii) <u>ආරම්භ කිරීමට පෙර මුළු වියදම</u>

| | |
|---|---|
| කර්මාන්තශාලා භූමිය සැකසීම | = රු. 20,000 |
| ජල පහසුකම් | = රු. 25,000 |
| තීන්ත සාම්පල් පරීක්ෂාව | = රු. 10,000 |
| වෙළෙඳපල පරීක්ෂා වියදම් | = රු. 8,500 |
| ආරම්භක දින උත්සව වියදම් | = රු. 12,000 |
| බලපත්‍ර ලබාගැනීමට | = රු. 500 |
| | රු. 76,000 |

*(වටිනාකම සමග එක් අයිතමයකට ලකුණු 1/2 බැගින් අයිතම 6ට ලකුණු 03 යි. සැලුවම පිළිතුර සපයා ඇත්නම් ලකුණු 03 යි)*

(iii) <u>මුළු ආයෝජන මුදල</u>

| | |
|---|---|
| ස්ථාවර වත්කම්වල වටිනාකම | = රු. 4,170,000 |
| ආරම්භ කිරීමට පෙර වියදම් | = රු. 76,000 |
| දෛනික ව්‍යාපාර අවශ්‍යතාව | = රු. 50,000 |
| | රු. 4,296,000 |

*(වටිනාකම සහිතව එක් අයිතමයකට ලකුණු 01ක් සහ අවසන් පිළිතුරට ලකුණු 01 යි. මුළු ලකුණු 04 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....